


විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA

Journal of Language, Literary, Cultural and Media Studies

Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2020, 01 (01): 01-07

ISSN: 2235-9001

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya


# අලංකාර ශාස්ත්‍රයට උද්භටගේ දායකත්වය


**මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමි**

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

knarada@sjp.ac.lk



## සංක්ෂේපය

පෙරදිග විචාර කලාවේ අලංකාරවාදීන් අතර උද්භට විශිෂ්ටයෙකි. ඔහු කාශ්මීරියානු ගුරුකුලයට අයත් වූවෙකි. භාමහවිවරණ, කුමාරසම්භව, කාව්‍යාලංකාර සාර සංග්‍රහ ඔහුගේ රචනා සේ සැලකේ. කාශ්මීරියානු ගුරුකුලයත් ඉන්දියාවේ නැගෙනහිර බටහිර හා දකුණ පුරා පැතිරී සිටි වෙනත් කාව්‍ය විචාර කලාව හා සම්බන්ධ ආචාර්යවරුන්ගේ අදහස් සංකල්ප මතවාදවලත් නිර්මාණකරණය සම්බන්ධයෙන් විවිධ වෙනස්කම් හඳුනා ගැනීමට පිළිවන. ඒවා ගුණ, දෝෂ, අලංකාර යන ප්‍රධාන මාතෘකා තුනට බෙදා සාකච්ඡා කළ හැකිය. කාශ්මීරියානු ගුරුකුලවාදීහු ගුණ තුනකැ'යිද දෝෂ සතරකැ'යිද පවසති. එහෙත් සෙස්සෝ ඒවා දහය බැගින් ඇතැයි කියති. රීති දෙකකැ'යි කාශ්මීරියානුවන් පවසන අතර සෙසු විචාරවාදීහු ඊට වඩා වැඩි සංඛ්‍යාවක් දක්වති. එපමණක් නොව අන්තර්ගතයද සම්පූර්ණයෙන් වෙනස් වේ. ඇතැම්  අලංකාරවලින් එම කාර්යය සිදු නොවන බව දක්වා ඒවා කාශ්මීරියානුවෝ බැහැර කරති. එහෙත් සෙසු පාර්ශ්වවල ඒවා ප්‍රධාන අලංකාර සේ පිළිගැනේ. මෙම මතවාදී ගැටීම ඔවුනොවුන්ගේ ස්වාධීනතාවම තහවුරු කොට ඇත. එසේම විචාර සංකල්පවල අභිවෘද්ධියටද එවා හේතු වනු දැකිය හැකිය. උද්භට තම කාව්‍යාලංකාර සාර සංග්‍රහයේ අලංකාර 36ක් දක්වයි. ඒවායින් අවසාන දෙක එනම් කාව්‍යලිංග/කාව්‍යහේතු හා කාව්‍ය දෘෂ්ටාන්ත යන දෙක  මෙතෙක් නුදුටු නවතම අලංකාර දෙකකි. මෙම අලංකාර තිස්හය ප්‍රභේද සමගින් ගත් කල සංඛ්‍යා ප්‍රමාණයෙන්  හැත්තෑහතකි. මොහුගේ ආචාර්ය පරම්පරාවේ විද්වත්හු ශබ්දාලංකාර ගැන වැඩි අවධානයක් යොමු නොකළහ. උද්භට තම කෘතියේදී ශබ්දාලංකාර වර්ග හතරක් හඳුන්වා දෙයි. ඒ අතර මෙතෙක් පිළිගෙන තිබූ යමක නමින්  හැඳින්වූ අලංකාරය බැහැර කොට ඇත. එම ශබ්දාලංකාර මෙසේය. පුනරුක්තවදාභාස, ඡේකානුප්‍රාස, අනුප්‍රාස, ලාටානුප්‍රාස වශයෙනි. මේ ශබ්දාලංකාර එකිනෙක ගැන කරන විවරණය උද්භටටම ආවේණික වූවකි. අනුප්‍රාස ශබ්දාලංකාරය ශබ්ද පදනම් කරගෙන පරුෂා, උපනාගරිකා, ග්‍රාම්‍යා යනුවෙන් වර්ග කොට ඇත. ලටානුප්‍රාසයේද කොටස් පහකි. එනම් එකෛකපදාශ්‍රය ලාටානුප්‍රාසය, පදසමුදායාශ්‍රය ලාටානුප්‍රාසය, ස්වතන්ත්‍ර පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය, පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය, සාමාසික පරතන්ත්‍ර ලාටානුප්‍රාසය වශයෙනි. ශබ්දාලංකාර ක්ෂෙත්‍රයට උද්භටගේ  දායකත්වය එපරිද්දෙනි.



**මුඛ්‍ය පද:** උද්භට, අලංකාර ශාස්ත්‍රය, ගුරුකුලය, ජයාපීඩ, ගුණ-දොස්

## 1. හැඳින්වීම

භට්ටෝද්භට නැතහොත් උද්භට (ක්‍රි:ව 750-850) ඉන්දියාවේ උතුරේ වයඹට බර කාශ්මීර දේශයේ වැසියෙකි (De, 1926: p.126-38). අද කාශ්මීරය ගැන කියවන විට යුද කෝලාහල, දේශසීමා ගැටුම්, වර්ගවාදී අරගල ගැන දැන ගන්නට ලැබේ. එහෙත් උද්භට ජීවත් වූ ''ජයාපීඩ'' (ක්‍රි. ව. 779-813) රාජ්‍ය සමය අවන්ති වර්මන් රාජ්‍ය සමය වැනි කාලයේ බුද්ධිමතුන්ට, උගතුන්ට, ප්‍රාඥයන්ට, විචාරකයන්ට, කවීන්ට, දාර්ශනිකයන්ට, පාරගවේෂී මුනිවරුන්ට තෝතැන්නක් විය.

කාශ්මීර වැසියකු වන භාමහ සිය කාව්‍යාලංකාර ග්‍රන්ථයේ රාමස්වාමී මේධාවින් රාජමිත්‍ර රාම ශර්මණ (Tatacharya, (ed.) 1934: p. 38, 44, 45, 49) ආදි වශයෙන් තමාට පූර්වගාමී වූ කවිවරුන් ගැන සඳහන් කරයි. එසේම කාශ්මීරියානු විද්වත් පරපුර ගැන කරුණු අධ්‍යයන කරන විට උද්භට, ආනන්දවර්ධන, ඉන්දුරාජ, රුද්‍රට, මුකුල, අභිනවගුප්ත, මහිමභට්ට, ක්ෂේමේන්ද්‍ර, රුය්යක, මම්මට, ජය්යට, කය්යට, අල්ලට වැනි විද්වත්හුද හමුවෙති. මෙම ආචාර්ය පරම්පරාව සහ ඔවුන්ගෙන් වූ සේවය අලංකාර ශාස්ත්‍රය අධ්‍යයන කරන විට අමතක කළ නොහැකිය.

උද්භට මෙම ඇදුරු පරපුරේ ආදිතමයෙකි. ඔහු භාමහගේ කාව්‍යාලංකාරයට ''භාමහවිවරණ'' නමින් ව්‍යාඛ්‍යාවක්ද, ''කුමාරසම්භව'' නමින් කාව්‍ය ග්‍රන්ථයක්ද, (Banhatti, (ed.) 1925: p. 16) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට ව්‍යාඛ්‍යාවක්ද කළ බව දැක්වේ (Kane, 1988: p.138). අලංකාර ශාස්ත්‍රයට ඔහුගෙන් සිදු වූ විශිෂ්ට සේවය නම්, "කාව්‍යාලංකාර සාර සංග්‍රහ" නමින් ස්වාධීන කෘතියක් බිහි කිරීමයි. ''ලඝුවෘත්ති'' ඒ සඳහා ඉන්දුරාජ විසින් කරන ලද ව්‍යාඛ්‍යානය වේ. ''ප්‍රතීහාරෙන්දුරාජ'' යන නමද මොහුට භාවිත කරනු ලැබ ඇත. 1925 දී පෙළ සහ ව්‍යාඛ්‍යාන යන දෙකේ සංස්කරණයක් නාරායණදාස බන්හට්ටි විසින් සිදු කරනු ලැබ තිබේ.

මීට සමගාමීව ඉන්දියාව පුරා අලංකාර ශාස්ත්‍රය සම්බන්ධයෙන් ව්‍යාප්තව සිටි තවත් ඇදුරු පරපුරක්ද වූ බව දණ්ඩින්, වාමන, භෝජරාජ, හේමචන්ද්‍ර, වාග්භට වැනි විද්වතුන්ගේ, ඉගැන්වීම්වලින් ප්‍රකට වේ. මේ දෙපිරිස අතර අලංකාර ශාස්ත්‍රයේ ඇතැම් කරුණු ගැන සම්පූර්ණ එකඟතාවක් නොවීය. ඒ වෙනස ඔවුනොවුන්ගේ අනන්‍යතාව ප්‍රකට කරයි. එපමණක් නොව ඒ ඒ ආචාර්ය පරම්පරාවලද එකිනෙකාට වෙනස් ඒ ඒ පුද්ගලයන්ටම සාධාරණ වූ මතවාද අදහස් පැවති බව එම ගුරුකුලවල නිර්මාණ සමීක්ෂණයෙදී දැක ගත හැකිය. මෙම බුද්ධිමය සංවාද එම ශාස්ත්‍රයේ දියුණුවටම හේතු විය.

දණ්ඩින් ඇතුළත් ආචාර්ය පරම්පරාව ගුණ, දෝෂ, රීති ගැන විශේෂාවධානය යොමු කරයි. ගුණ දහයකුත්, දෝෂ දහයකුත්, රීති දෙකකුත් ඇතැයි පිළිගැනීම ඔවුන්ගේ සම්ප්‍රදායයි. එසේම අංකාරවලින් හේතු, සූක්ෂ්ම, ලේශ වැනි අලංකාර කෙරෙහිද අවධානය යොමු කර ඇත.

කාශ්මීරියානු ගුරුකුලය ගුණ පිළිගත්තද, එය ප්‍රමාණ වශයෙන් තුනකි. දෝෂ ගැන ඔවුන්ගේ ඉගැන්වීම් ඔවුන්ටම විශේෂ වූවකි.

> ශ්‍රුතිදුෂ්ටාර්ථදුෂ්ටෙ ච - කල්පනා දුෂ්ටමිත්‍යපි
>
> ශ්‍රුතිකෂ්ටං තථෛවාහුර් - වාචාං දොෂං චතුර්විධං (Tatacharya, (ed.) 1934: p. 25).

වචනයෙහි දොස් හතරකි එනම්,

ශ්‍රැති දුෂ්ට
අර්ථ දුෂ්ට
කල්පනා දුෂ්ට
ශ්‍රැති කෂ්ට  වශයෙනි.

වචන ඇසෙන විට ජුගුප්සාවක් දැනේ නම් එය ශ්‍රැතිදුෂ්ටයි. අර්ථ දැනෙන විට අසභ්‍ය දේ වැටහේ නම් එය අර්ථ දුෂ්ටයි. පද සන්ධානයේදී එනම්, පද දෙකක් එකට ගළපන විට එයින් මතුවන අර්ථය ගැන අනුචිත විඥානයක් ඇති වේ නම් එය කල්පනා දුෂ්ටයි. පද ශ්‍රවණයේදී කටුක බව දුක් සහගත බව දැනී, ''මීට වඩා මෙය හොඳින් කියන්න තිබුණා'' වැනි වැටහීමක් ඇති වේ නම් එය ශ්‍රැති කෂ්ටයි. එම වැරැද්ද අව්‍යුත්පත්තිය නිසා සිදු වේ. මීට අමතරව තවත් දෝෂ දහයක් දක්වා තිබේ.

වෛදර්භී හා ගෞඩී යන රීති දෙක පිළිගත්තත් ඒ දෙක ගැන කරන විග්‍රහය මුළුමනින්ම වෙනස් වූවකි.

''තන්ත්‍රීනිනාද සුභග පදබන්ධං හි වෛදර්භම්, න තථා ගෞඩීයමිති උච්‍යතෙ''
(Tatacharya, (ed.) 1934, p. 15).

ගුණ තිබුණත් නැතත් ව්‍යඤ්ජනා ශක්තියෙන් යුක්ත භාග්‍යවන්ත (රස පිරුණු) පද බැඳීම වනාහි වෛදර්භි රීතියයි. ඒවා නැති තැන ගෞඩීය රීතිය ලැබේ. වෛදර්භය නැති නම් කෝමල ලලිත පදවලින් බැඳුණු සුගායනීය ශ්‍රැතිරම්‍යතාව පමණක් ඇති නිර්මාණයකි. එය ගෞඩීය රීතියෙන් ලියැවුණක් බව පැවසිය හැකිය. හේතු, සූක්ෂ්ම, ලේශ, අලංකාර මෙම ගුරුකුලය උසස් ලෙස නොසලකයි.

හෙතුශ්ච සූක්ෂ්මො ලෙශොථ - නාලංකාරතයා මතඃ
සමුදායාභිධානස්‍ය - වක්‍රොක්ත්‍යනභිධානතඃ (Tatacharya, (ed.) 1934, p. 48).

මෙම අලංකාරවල වාච්‍යය හා වාචකය හැරුණු කොට අලංකාරයක් නොමැති බව ඔවුන්ගේ පිළිගැනීමයි. කිසියම් තැනක වක්‍රොක්තිය වේද එතැන කවිය ඇත. අලංකරණයද ඇත. මෙසේ ගුරු පරපුරු දෙකක බුද්ධිමය සංකථනවලින් පෙරදිග සෞන්දර්ය කලාව පෝෂණය වී ඇති බව ප්‍රකට වේ.

## 2. සාකච්ඡාව

උද්භටගෙන් අලංකාර ශාස්ත්‍රයට සිදු වූ සේවා අතර ***කාව්‍යලංකාර සාර සංග්‍රහයට*** ලැබෙන්නේ සුවිශේෂ තැනකි. මෙම ග්‍රන්ථයේ පරිච්ඡේද හඳුන්වා ඇත්තේ වර්ග නාමයෙනි. එබඳු වර්ග හයකි. එම වර්ගවලින් ශබ්දාලංකාර හා අර්ථාලංකාර සාකච්ඡා කර තිබේ.

උද්භට අර්ථාලකාර අතුරින් මුලින්ම දක්වන්නේ රූපකය. එහි භේද හතරකි. දීපකාලංකාරය භේද තුනක් සමඟ දක්වන අතර ඊළඟට දක්වන්නේ උපමාලංකාරයයි. එහි භේද 17කි. ලඝුවෘත්ති ව්‍යාඛ්‍යාව ලියූ ඉන්දුරාජ එහි භේද 21ක් බව කියයි. ප්‍රථම පරිච්ඡේදය මින් අවසන් වේ. දෙවන පරිච්ඡේදය ආරම්භ වන්නේ ආක්ෂේපාලංකාරයෙනි. එහිද භේද දෙකකි. අර්ථාන්තරන්‍යාසයේ භේද හතරකි. එම විග්‍රහවලින් දෙවන පරිච්ඡේදය අවසන් වේ. තෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කරන්නේ යථාසංඛ්‍ය උත්ප්‍රේක්ෂා ස්වභාවෝක්ති යන අලංකාර තුනකි. සිවුවැන්නෙන් ප්‍රේය රසවත් ඌර්ජස්වී පර්යායෝක්ත සමාහිත උදාත්ත හා ශ්ලිෂ්ට යන අලංකාර සාකච්ඡා කෙරේ. ශ්ලිෂ්ටාලංකාරය ආලංකාරිකයන් අතර දැඩි අවධානයට පාත්‍ර වූවකි. උද්භටගේ අදහස අනුව භාවිත ශබ්දාශ්‍රයෙන් එක අදහසක් ප්‍රකාශ වන විට ඒ අදහස හා බැඳී ඊට සමගාමීව වෙනත් අදහසක් මතු වී පෙනීම ශ්ලිෂ්ට නම්

වෙයි. එම මතු වී බැඳී ප්‍රකට වන ස්වභාවය අර්ථයේ පමණක් නොව ශබ්දවලද පැවතිය යුතු බව ඔහු පෙන්වා දෙයි. මෙම අලංකාරයම පසු කාලයේ ශබ්ද ශ්ලිෂ්ට හා අර්ථ ශ්ලිෂ්ට යනුවෙන් කොටස් දෙකකට කඩා සාකච්ඡා කිරීමට පෙලඹී ඇත. පස්වෙනි පරිච්ඡේදයේ අපහ්නුති, විශේෂෝක්ති, විරෝධ, තුල්‍යයෝගිතා, අප්‍රස්තුතප්‍රශංසා, ව්‍යාජස්තුති, විදර්ශනා යන අලංකාර සාකච්ඡා කෙරේ. මේවාහි පසු කාලයේ භේද ඇති වුවත් මේ වන විට එබඳු බෙදීමක් පැවති බව දක්නට නොලැබේ. ''විදර්ශනා'' යන අලංකාරය ගැන විද්වතුන් අතර කුකුසක් මතු වී ඇත්තේ එහි මාතෘකාවත්, නිදසුනත් අතර පවතින නොගැළපීම හේතුවෙනි. කාශ්මීරියානු හා සෙසු ආලංකාරිකයන්ද විදර්ශනා යනුවෙන් අලංකාරයක් දක්වා නැත. ඒ වෙනුවට එම අලංකාර ලේඛනයේ දක්වා ඇත්තේ ''නිදර්ශන'' යනුවෙනි. කාව්‍ය ශාස්ත්‍රය ගැන ප්‍රාමාණික උගතෙකු වන පී.වී. කානේ මේ ගැන ප්‍රකාශ කරන්නේ පිටපත් කිරීමේදී මුල් කාලයේම සිදු වූ අතපසු වීමක් විය හැකි බවයි (Kane, 1998: p.134). මීළඟට සංකර යනුවෙන් නවතම අලංකාරයක් හඳුන්වා දෙන අතර එහි සන්දේහ, සංකර, ශබ්දාර්ථවර්ත්‍යලංකාර සංකර, ඒක ශබ්දාභිධාන සංකර, අනුග්‍රාහ්‍යානුග්‍රාහ සංකර යනුවෙන් භේද හතරක්ද සාකච්ඡා කරයි. මෙම අලංකාරය පසුකාලීන සියලු ආලංකාරිකයන් විසින් ආදෘතය. උපමේයෝපමා, සහෝක්ති පරිවෘත්ති යන අලංකාර සමඟ පස්වෙනි පරිච්ඡේදය නිම වේ. පරිවෘත්තිවල භේද තුනකි.

හයවෙනි පරිච්ඡේදය අනන්වය අලංකාරයෙන් ආරම්භ වේ. සන්දේහ අලංකාරයේ භේද දෙකකි. ඊළඟට සංසෘෂ්ටිය ලැබේ. අනතුරුව එන්නේ භාවිකාලංකාරය යි. උද්භට දැනට ශේෂව ඇති සිය කෘතියේ අවසානයට අලුතින් අලංකාර දෙකක් එකතු කරයි. එනම් කාව්‍යලිංග/කාව්‍යහේතු හා කාව්‍යදෘෂ්ටාන්ත යන දෙකයි. ඒ අනුව අලංකාර ශාස්ත්‍රයට නවතම අර්ථාලංකාර එකතු කොට සිය ගුරුකුලයේ ඔහුගේ නම සුරක්ෂිත කර ගෙන ඇත.

කාශ්මීරියානු ගුරුකුලය ශබ්දාලංකාර සම්බන්ධයෙන් දක්වන්නේ අල්ප අවධානයකි. භාමහ ඔහුගේ කාව්‍යාලංකාර ග්‍රන්ථයේ ශබ්දාලංකාර දෙකක් පමණක් දක්වයි. එනම් අනුප්‍රාස හා යමක වශයෙනි (Tatacharya, (ed.) 1934: p. 32). අනුප්‍රාසයේ භේද තුනකුත්, යමකයේ භේද පහකුත් දක්වා තිබේ. උද්භට ශබ්දාලංකාර හතරක් ඉදිරිපත් කරයි. ආනන්දවර්ධන, අනුප්‍රාස, යමක ගැන අවධානය යොමු වීම මුඛ්‍යාර්ථයට බාධාවක් විය හැකි බැවින් ධ්වනි කාව්‍ය නිර්මාණයේදී ඒ ගැන නොසිතීම වඩාත් යහපත් බව පවසයි (Krishnamoorthy, (trans. & ed.) 1982: p. 56). මම්මට ස්වපරපුරේ අනුදත් ශබ්දාලාංකාරවලින් කිහිපයක් පමණක් භාවිතයට ගනියි (Ganganath Jha, (trans.) 1924: p. 317-330). ඔහුටද උද්භටගේ අදහස් ඉක්මවා යෑමට අවකාශ සැලසී නොමැත.

උද්භට අර්ථලංකාරවලදී තම ගුරුකුලයේ නම රැක ගත්තා සේම ශබ්දාලංකාරවලදීද තම අනන්‍යතාව තහවුරු කර තැබීමට කටයුතු කර ඇත. ඔහු ශබ්දලාංකාර හතරක් ඉදිරිපත් කරයි.

පුනරුක්තවදාභාස
ඡේකානුප්‍රාස
අනුප්‍රාස
ලාටානුප්‍රාස වශයෙනි.

මෙම විග්‍රහය දෙස බැලීමේදී භාමහ හඳුන්වා දුන් ''යමක'' ශබ්දාලංකාරය උද්භට බැහැර කොට ඇත. එසේම පුනරුක්තවදාභාස නමින් නවතම ශබ්දාලංකාරයක් හඳුන්වාදීම සිදු කර තිබේ.

පුනරුක්තවදාභාස යනු බැලු බැල්මට වෙනත් පද දෙකකින් එකම අර්ථයක් ගෙන දේ යැයි හැඟී ගියත් එය එසේ නොවීමයි. ඡේකානුප්‍රාස යනු මිහිරි සමාන අකුරු සහිත පද දෙකක් හෝ පද කිහිපයක් දෙසැරයක් බැගින් යෙදීමයි. එක් වරක් යෙදී නැවත වරක් යෙදීම ඡේකානුප්‍රාස යනුවෙන් හැඳින් වේ. විදග්ධයන්ට රුචි වූ අනුප්‍රාසය යන අදහසද '' ඡේක'' නම් වූ පක්ෂි විශේෂයේ මිහිරි හඬට සමාන යන අරුතද මෙහි ගැබ්ව ඇති බව විද්වත් මතයයි.

අනුප්‍රාස යනු මිහිරි සමාන අකුරු සහිත පද නැවත නැවත යෙදීමයි. දණ්ඩින් මෙය හඳුන්වන්නේ ''වර්ණාවෘත්තිරනුප්‍රාසඃ'' යනුවෙනි. වර්ණයන්ගේ ආවෘත්තිය නැවත නැවත යෙදීම අනුප්‍රාස නම් වන බවයි. එහෙත් උද්භට, රස වඩාත් තහවුරු වන සේ වෘත්ති තුනේ එනම් පරුෂා, උපනාගරිකා, ග්‍රාම්‍යා යන වෘත්තිවල සමාන ව්‍යඤ්ජන වෙන වෙනම වර්ග කොට, නැවත නැවත යෙදීම අනුප්‍රාස ලෙස දක්වයි.

සරූප ව්‍යඤ්ජනන්‍යාසං - ත්‍රිෂ්වෙතාෂු වෘත්තිෂු
පෘථක් පෘථගරනුප්‍රාස - මුශන්ති කවයඃ සදා (Banhatti, (ed.) 1925: p. 04).

අනුප්‍රාසාලංකාරයේ ප්‍රථම භේදය පරුෂානුප්‍රාසයයි. එනම් ශ, ෂ, ර් (ක්‍ර, ර්ක) ට වර්ගය, හ්ව, හ්‍ය යන අකුරු එකක් හෝ කිහිපයක් නැවත නැවත යෙදීමයි.

යත්‍ර තොයාශයාශෙශ - ව්‍යාකොශිතකුශෙශයා
චකාශෙ ශාලිකිංශාර - කවිශාශාමුඛා ශරත් (Banhatti, (ed.) 1925: p. 05).

මෙහි ශ නැවත නැවත යෙදී ඇත.

අනුප්‍රාසයේ දෙවන ප්‍රභේදය උපනාගරිකා යනුයි. සමාන අකුරුවල සංයෝගය එනම් ක්ක, ජ්ප, ච්ච, වර්ගාන්ත, ඪක, ඤ්ච, ණ්ට, න්ත, ම්ප, ක සිට ම දක්වා අකුරු ද ඒවායින් යුක්ත ක, කා, කි, කී ආදි ස්පර්ෂද සහිත නිර්මාණ උපනාගරිකා නමින් හැඳින් වේ.

උදාහරණ:

සාන්ද්‍රාරවින්දවෘන්දොත්ථ - මකරම්දාම්බුබින්දුභිඃ
ස්‍යන්දිභිඃ වසුන්දරස්‍යන්දං - නන්දිතෙන්දිරාක්වචිත් (Banhatti, (ed.) 1925: p. 06).

මෙහි න, න්ද ශබ්ද නැවත නැවත යෙදී ඇත. උපනාගරිකා යන්නේ අරුත නගරයේ විලාසිතාවන්ගෙන් සැදී මැනවින් ඇඳ පැළඳගත් කාන්තාව යන්නයි.

තුන්වැන්න ග්‍රම්‍යා/කෝමලා අනුප්‍රාසයයි. පරුෂා උපනාගරිකාදි අනුප්‍රාසවලට නොගත් සරලවාචී ඉතිරි අකුරුවලින් ග්‍රාම්‍යානුප්‍රාසය සැකසේ.

උදාහරණ:

කෙලිලොලාලිමාලානාං - කලෛඃ කොලාහලෛඃ ක්වචිත්
කුර්වීතකානනාරූඪ - ශ්‍රිනූපුරරවභ්‍රමම් (Banhatti, (ed.) 1925: p. 05).

ගුජරාටයේ නැතහොත් ලාට දේශයේ භාවිත වන අනුප්‍රාස විශේෂය ලාටානුප්‍රාස නම් වේ. මෙම අනුප්‍රාසය ගැන දිර්ඝ ලෙස කරුණු සාකච්ජා කරන්නේ උද්භට පමණි. මොහුගෙන් පසු මෙම අනුප්‍රාසය සෙසු කවීන්ගේද විශේෂාවධානයට පාත්‍ර නොවීය.

උද්භට දක්වන විග්‍රහයන්ට අනුව ලාටානුප්‍රාස යනු පුනරුක්ත කරනු ලබන ශබ්දවල ප්‍රකෘති අර්ථ සමාන වුවත් වාක්‍යයේ එම ශබ්ද හා අර්ථවලින් ලැබෙන තාත්පර්යාර්ථය පමණක් වෙනස් වේ. එබැවින් ලාටානුප්‍රාසය යමකය නොවන බව පවසමින් හේ මෙසේ කියයි. ශබ්ද නැවත නැවත යෙදීම කෙනෙකුට යමකය සේ පෙනී ගියද, එම ශබ්දවලින් ලැබෙන තාත්පර්යාර්ථය සලකා බැලීමේදී එය යමකාලංකාරය නොවන්නේය. කාව්‍යාලංකාර සාර සංග්‍රහයට ව්‍යාඛ්‍යාන සැපයූ ප්‍රතීහාරෙන්දුරාජ මෙසේ කියයි. ඔවුන්ගේ ශබ්ද හා ඔවුන්ගේ ප්‍රකෘති අර්ථ සමාන වුවත්, වෙනත් අර්ථයක් (තාත්පර්යාර්ථයක්) ගෙන දෙමින් ශබ්ද සම්බන්ධී ප්‍රත්‍යය හෝ (සුප්, තිඞ් ආදිය) පද

සම්බන්ධි ප්‍රත්‍යය හෝ (සුප්, තිඞ් ආදිය) හෝ ඒ දෙවර්ගයම හෝ නැතිව එම සමාන ශබ්දවල තාත්පර්යාර්ථයේ වෙනසකට අදාළව පුනරුක්ත භාවිතය ලාටානුප්‍රාස නම් වේ. උද්භට දක්වන ආකාරයට එහි ප්‍රභේද පහකි.

එකෛකපදාශ්‍රය ලාටානුප්‍රාසය
පදසමුදායාශ්‍රය ලාටානුප්‍රාසය
ස්වතන්ත්‍ර පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය
පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය
සාමාසික පරතන්ත්‍ර ලාටානුප්‍රාසය

එකෛකපදාශ්‍රය ලාටානුප්‍රාසය යනු වෙනත් පද දෙකක යෙදීමයි.

උදාහරණ:

කාශාඃ කාශා ඉවොද්භාංසි - සරාංසීව සරාංසි ච
චෙතාංස්‍යාවික්ෂිපුර්යූනාං - නිම්නගා ඉව නිම්නගාඃ

පදසමුදායාශ්‍රය ලාටානුප්‍රාය යනු මුළු පාද දෙකේම අනුප්‍රාසය ලැබීමය.

ස්ත්‍රියො මහති භර්තෘභ්‍ය - ආගස්‍යාපි න චුකෘධුඃ
භර්තාරොපි සති ස්ත්‍රීභ්‍ය - ආගස්‍යාපි න චුකෘධුඃ

ස්වතන්ත්‍ර පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය යනු තාත්පර්යාර්ථභේදය සලකා පුනරුක්ත භාවිතයයි. එකක පදාන්තරානුවේශයත්, අනෙකේ ස්වතන්ත්‍රත්වයත් දැකිය හැකිය.

උදාහරණ:

පද්මිනීං පද්මිනීගාඪස් - පෘභයාගත්‍ය මානසාත්
අන්තර්දත්තුරයාමාසුර් - හංසා හංසකුලාලයාත්

පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය යනු බද්ධ ශබ්ද වෙනත් පද දෙකක හා බැඳීමයි. මෙයද ශබ්දවලින් ලැබෙන තාත්පර්යාර්ථය සලකා සිදු වේ.

උදාහරණ:

ක්වචිදුත්ඵුල්ලකමලා - කමලභ්‍රාන්ත ෂට්පදා
ෂට්පදක්වාන මුඛරා - මුඛරස්ඵාර සාරසා

සාමාසික පරතන්ත්‍ර ශබ්දාශ්‍රය ලාටානුප්‍රාසය යනු බද්ධ ශබ්ද එක සාමාසික (සමාසයට අයිති) පදයක ලැබීම වේ.

උදාහරණ:

ජිතාන්‍ය පුෂ්ප කිඤ්ජල්ක - කිඤ්ජල්කශ්‍රෙණි ශොභිතම්
ලෙභෙවතංසතාං නාරී - මුඛෙන්දුෂ්වසිතොත්පලම් (Bonatti, (ed.) 1925: p.07-14).

ලාටානුප්‍රාස ගැන උද්භට කරන විග්‍රහය අවධානයට භාජන නොකොට මෙම උදාහරණ සලකා බැලුවහොත් ඒවා මෙතෙක් අප දැක ඇති යමකාලංකාර සඳහා දී ඇති උදාහරණවලට සමානය. එය එසේ වුවත් උද්භට පවසන්නේ ඒවා යමලංකාර නොවන බවයි. තාත්පර්යාර්ථය සලකා එම පුනරුක්ත පද භාවිත කොට ඇති බවයි. පසුකාලීන තම ගුරුකුලේ කවීන්ද මෙම ලාටානුප්‍රාසය අමතක කර දමා ඇත. මම්මටගේ කාව්‍ය ප්‍රකාශයේද මේ ගැන අවධානය යොමු නොකරයි. එසේම යමකාලංකාරය ගැනද කරුණු සාකච්ජා නොකරයි. එහෙත් දණ්ඩින්

ඇතුළත් සෙසු ඉන්දියානු ගුරුකුලය යමක දිර්ඝ වශයෙන් සාකච්ජා කොට එහි භේද, අනුප්‍රභේද රාශියක් දක්වා ඇත.

මෙසේ උද්භට තමා උගත් ශාස්ත්‍රයට ඔහුගෙන් ඉටුවිය යුතු යුතුකම ඉටු කරමින් අලංකාර ශාස්ත්‍රයේ ප්‍රගමනයට විශේෂ මෙහෙයක් සිදු කර ඇති බව ප්‍රකට වෙයි. ඔහුට ජයාපීඩ රජ සබය සැලකූ ආකාරය දැක්වෙන උදාහරණයක් කාව්‍යාලංකාර සාර සංග්‍රහ සංස්කරණය කළ නාරායන දාස මෙසේ උපුටා දක්වයි (Banhatti, (ed.) 1925: p. xi).

> විද්වාන්දිනාර ලක්ෂෙණ - ප්‍රත්‍යහං කෘත වෙතනඃ
> භට්ටොභුද්භටස්තස්‍ය - භූමිභර්තුඃ සභාපතිඃ

ජයාපීඩ රජසබයේ සභාපති වූ භට්ටොද්භටට දිනපතා දිනාර ලක්ෂයක් ගෙවූ බව මෙහි සඳහන් වේ. ඔහුගේ පාණ්ඩිත්‍යයට දැක් වූ ගෞරවයත් ඔහුට ලැබුණු පිළිගැනීමත් මෙයින් මොනවට අවබෝධ වෙයි.

## 3. සමාලෝචනය

පෙරදිග කාව්‍ය විචාරවාද ගැන සැලකීමේදී උද්භට මුලම යුගයේ ජීවත් වූ විෂයාවබෝධයෙන් පිරිපුන් ප්‍රාමාණික වියතකු සේ සැලකිය හැකිය. මෙම විද්වතාත්, ඔහුගේ ශාස්ත්‍රීය කටයුතු ගැනත් තොරතුරු අප්‍රකටය. උද්භට කාව්‍යාලංකාර සාර සංග්‍රහය රචනා කිරීමෙන් තම විෂයක්ෂේත්‍රය වූ අලංකාර ශාස්ත්‍රයට මහඟු මෙහෙයක් කළ අර්ථාලංකාර හා ශබ්දාලංකාර යන දෙගණයට නවතම අලංකාර හඳුන්වා දී එම ශාස්ත්‍රය පෝෂණය කළ විද්වතෙකි.

## පරිශීලිත මූලාශ්‍රය


Banhatti, Narayana Daso. (ed.) (1925). ***Kavyalankara Sara Sangraha of Udbhata with Commentary**, **the Laghuvritti of Induraja***, Poona: Bandarkar Research Institute.

De, Sushil Kumar. (1976). ***History of Sanskrit Poetics***, Calcutta: Firma KLM Private Limited.

Ganganath Jha, M.M. (trans.) (1924). ***Mammata's Kavyprakasha with English Translation***, Benaras: Vidya Prakasana.

Kane, P.V. (1998). ***History of Sanskrit Poetics***, Delhi: Motilal Benarasidass Publishers.

Krishnamoorthy, K. (ed.) (1982). ***Dhvanayaloka of Anandawardhana***, Delhi: Motilal Benarasidass Publishers.

Tatacharya Siromani, D.T. (ed.) (1934). ***Bhamaha's Kavyalankara***, Tiruvadi: The Sriniwasa Press.